# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## සුසරණ ලංකා පදනම (සංස්ථාගත කිරීමේ)

**සුසරණ ලංකා පදනම සංස්ථාගත කිරීම සඳහා වූ**
**පනත් කෙටුම්පතකි**

---

කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අසංක නවරත්න මහතා විසින්
2023 සැප්තැම්බර් මස 22 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2023 සැප්තැම්බර් මස 14 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

**[205 වන පනත් කෙටුම්පත]**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල :** රු. 30.00 **තැපැල් ගාස්තුව :** රු. 150.00

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## සුසරණ ලංකා පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව

"සුසරණ ලංකා පදනම" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන පදනමක්, එකී පදනමේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුව එකී පදනමට සම්බන්ධ සියලු කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද:

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, ඒ පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් එකී පදනම විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටුකර ඇති හෙයින් ද, එකී පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති බැවින් ද, ඒ ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය

**1.** මේ පනත 2023 අංක දරන සුසරණ ලංකා පදනම (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

සුසරණ ලංකා පදනම සංස්ථාගත කිරීම

**2.** (1) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මෙහි මින්මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) සුසරණ ලංකා පදනමේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් පිහිටුවනු ලබන සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් වශයෙන් මින් මතු ඇතුළත් කරනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාපිත මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) "සුසරණ ලංකා පදනම" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු ය. තවද එකී නාමයෙන් ඒ සංස්ථාපිත මණ්ඩලය විසින් ද, එයට විරුද්ධව ද සියලු අධිකරණවලදී නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද, පූර්ණ බලය සහ අධිකාරය ඊට ඇත්තේ ය.

(2) සංස්ථාපිත මණ්ඩලය 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම) පනතේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා ස්වේච්ඡා සමාජ සේවා සංවිධානයක්

වශයෙන් සලකනු ලැබිය යුතු අතර, එම පනතේ විධිවිධාන සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය සහ ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ පොදු පරමාර්ථ

**3.** සංස්ථාපිත මණ්ඩලය පිහිටුවනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) පූර්ණ පෞරුෂ වර්ධනයක් සහිත දැනුම, කුසලතා සහ ආකල්ප සහිත පුද්ගල සංවර්ධනය, මානුෂීය අදහස්, යහපත් සාර්ධර්ම සහ සදාචාරය වැඩි දියුණු කිරීමට සහ පෝෂණය කිරීමට අවශ්‍ය වන්නා වූ අධ්‍යාපන වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම;

(ආ) දීප ව්‍යාප්ත අඩු ආදායම්ලාභී පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට සිය අධ්‍යාපන කටයුතු ඵලදායී ලෙස ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය වන්නා වූ ආධාර අනුබල ලබා දීම;

(ඇ) පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ සහ පිරිවෙන්හි අධ්‍යාපනය ලබන භික්ෂූන්වහන්සේලාගේ සිංහල, ගණිතය, ඉංග්‍රීසි, විද්‍යාව, සංස්කෘත හා පාලි ඇතුළු වෙනත් භාෂාවන් පිළිබඳ දැනුම, ආගමික අධ්‍යාපනය සහ පරිගණක හා තාක්ෂණික දැනුම වර්ධනය කිරීම සඳහා අදාළ අංශයන්හි ප්‍රවීණයන් මගින් දැනුවත් කිරීමේ වැඩමුළු සහ අවශ්‍ය පරිදි පාසල් ළමුන් සහ අධ්‍යාපනය ලබන භික්ෂූන්වහන්සේලා සඳහා සුදුසු අධ්‍යාපනික සම්මන්ත්‍රණ, වැඩමුළු, සමූහ අධ්‍යාපන වැඩසටහන් සහ දේශන දිවයින පුරා පැවැත්වීම;

(ඈ) පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ විද්‍යා අධ්‍යාපනය වැඩිදියුණු කිරීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් තොරතුරු තාක්ෂණික මධ්‍යස්ථාන පිහිටුවීම සහ පාසල් ශිෂ්‍යා ශිෂ්‍යාවන්ගේ සහ පිරිවෙන්හි අධ්‍යාපනය ලබන භික්ෂූන්වහන්සේලාගේ භාවිතය සඳහා පුස්තකාල පිහිටුවා ඒවා ප්‍රශස්ත මට්ටමින් පවත්වාගෙන යාම, පොත්පත්, සඟරා කලාප සහ වාර සඟරා ආදියට දායකවීම සහ ඒවා නිකුත් කිරීම;

(ඉ) පාසල් ළමුන් සහ යෞවන ප්‍රජාව සඳහා ජාති, ආගම්, කුල භේදයෙන් තොරව අධ්‍යාපනික, ආගමික,සංස්කෘතික, කලා හා ක්‍රීඩා පහසුකම් දියුණු කිරීම, ආධාර උපකාර කිරීම සහ ඔවුන්ගේ විනය හා සංස්කෘතික සාරධර්මයන් ආරක්ෂා කිරීම සහ ඒවා පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන්නා වූ විධිවිධාන සැලැස්වීම, ඔවුන් සඳහා සුදුසු නායකත්ව පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම;

(ඊ) පාසල් දරුවන් අතර විද්‍යාත්මක, තාක්ෂණික නව නිපැයුම් බිහි කිරීමටත්, සාහිත්‍යය, ප්‍රාශාංගික කලා, සිනමාව වැනි ක්ෂේත්‍රවල නව නිර්මාණ බිහි කිරීමටත් අවශ්‍ය පහසුකම් සැපයීම, දැනුම ලබාදීම, තරග හා ප්‍රදර්ශන පැවැත්වීම, පොත්පත්, සමරු කලාප, සඟරා මුද්‍රණය කිරීම;

(උ) ජනමාධ්‍ය සහ නව මාධ්‍ය භාවිතය පිළිබඳ පාසල් සිසුන්ට න්‍යායික හා ප්‍රායෝගික අවබෝධය ලබා දීමට අවශ්‍ය වැඩසටහන්, උපකරණ සහ අනෙකුත් පහසුකම් ලබා දීම;

(ඌ) තිරසර කෘෂිකර්මාන්තය හා පරිසරය සංරක්ෂණය පිළිබඳ පාසල් සිසුන් අතර න්‍යායික හා ප්‍රායෝගික දැනුම පුළුල් කිරීම සඳහා වැඩසටහන්, තරඟ ආදිය පැවැත්වීම, ආදර්ශ පරිසර පද්ධතීන් සැකසීම සහ ආදර්ශ ගොවිපළ සැකසීම;

(එ) ළමා හා වැඩිහිටි අයිතිවාසිකම් පිළිබඳව අවබෝධය පාසල් දරුවන් හා අනෙකුත් සමස්ත සමාජය තුළ ඇති කිරීමට අවශ්‍ය දැනුවත් කිරීමේ වැසටහන් පැවැත්වීම, ළමා හා වැඩිහිටි අයිතිවාසිකම් ප්‍රවර්ධනයට අවශ්‍ය කටයුතු සම්පාදනය;

(ඒ) අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ගේ පූර්ව ළමාවිය සහ ප්‍රාථමික අධ්‍යාපනය සංවර්ධනය කිරීමට ඔවුන් සඳහා ප්‍රාදේශීය මට්ටමින් පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන පිහිටුවීම, ඒවාට අවශ්‍ය දෑ සැපයීම සහ ඒවා නඩත්තු කොට පවත්වාගෙන යාම;

(ඔ) දීපව්‍යාප්ත ආබාධිත හා මන්ද මානසික දූ දරුවන්ගේ සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය වන්නා වූ පහසුකම් සැපයීම, ඔවුන් සඳහා දිවා සුරැකුම් මධ්‍යස්ථාන සහ නේවාසිකාගාර පවත්වාගෙන යාම, එම නේවාසිකයන්ගේ මානසික සුවතාවය සඳහා පුස්තකාල ඇතුළු අනෙකුත් යටිතල පහසුකම් ලබාදීමට කටයුතු කිරීම;

(ඕ) දිවයින පුරා වෙසෙන අඩු ආදායම්ලාභී සහ දුප්පත් අසරණ රෝගීන්ට අවශ්‍ය වන්නා වූ නිර්දේශිත ඖෂධ මිලදී ගැනීමට අවශ්‍ය මූල්‍යාධාර සැපයීම, ඔවුන්ට දෛනිකව ලබාදිය යුතු ඖෂධ නිසි ලෙස ගබඩා කර තැබීමට අවශ්‍ය ශීතකරණ වැනි පහසුකම් සැපයීම සහ එවැනි රෝගීන් සඳහා ආරක්ෂිතව හා නිසි ප්‍රමිතියකට පිළියෙල කරන ලද පෝෂ්‍යදායී ආහාර වේල් නොමිලයේ පිරිනැමීම සඳහා ප්‍රාදේශීය මට්ටමින් වැඩපිළිවෙලක් සකස් කිරීම සහ එම කාර්යයන් සඳහා අවශ්‍ය වන්නා වූ මූල්‍ය සහ අනෙකුත් ප්‍රතිපාදනයන්, අසරණ රෝගීන්ගේ සුබසාධනය වෙනුවෙන් කටයුතු කරනු ලබන දේශීය හා විදේශීය ජනතාව හා සංවිධාන සමග සහයෝගීව සම්පාදනය කර ගැනීම;

(ක) සංස්ථාපිත මණ්ඩලයේ ඉහත දැක්වෙන පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති දේශීය හා විදේශීය සංවිධාන සමග සහයෝගීව කටයුතු කිරීම;

(ග) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීමෙහිලා අවශ්‍ය වන්නා වූ කටයුතුවල නිරතවන ස්වේච්ඡා සේවකයන්ට සහ වෙනත් තැනැත්තන්ට ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම, මුදලින් හෝ අන්‍යාකාරයකින් ආධාර දීම;

(ච) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ප්‍රවර්ධනය කර ඒවා මුදුන්පත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකාවෙහි හෝ විදේශීන්හි සම්මේලන, සම්මන්ත්‍රණ, වැඩමුළු, සමූහ අධ්‍යාපන වැඩසටහන් සහ දේශන පැවැත්වීම, ඒවා සඳහා අනුග්‍රහය දැක්වීම සහ එකී කාර්යය සඳහා යෝග්‍ය යයි සංස්ථාපිත මණ්ඩලය විසින් සලකනු ලබන පොත්, වාර සඟරා, පත්‍රිකා, ප්‍රවෘත්ති පත්‍ර සහ සඟරා මුද්‍රණය කිරීම, ප්‍රකාශයට පත් කිරීම සහ ඒවා බෙදාහැරීම; සහ

(ජ) සංස්ථාපිත මණ්ඩලයේ සියලු පරමාර්ථ හෝ ඉන් කිසිවක් මුදුන්පත් කර ගැනීම සඳහා යෝග්‍ය වෙතැයි සළකනු ලබන සහ ඒ සඳහා අවශ්‍ය ආනුෂංගික හෝ හිතකර වෙනත් යම් ක්‍රියා සහ දේ ඉටු කිරීම.

රජයේ හෝ පළාත් සභාවක, අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක කටයුතු සමග ගැටුම් ඇති නොවන බවට සංස්ථාපිත මණ්ඩලය සහතික විය යුතු බව

**4.** සංස්ථාපිත මණ්ඩලය විසින් සිය පරමාර්ථ ලිඛිත නීතිවලට අනුකූලව ක්‍රියාත්මක කළ යුතු අතර, එම පරමාර්ථ, ආණ්ඩුවේ යම් අමාත්‍යාංශයක් හෝ දෙපාර්තමේන්තුවක් විසින් හෝ යම් පළාත් සභාවක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ විසින් ඊට සමගාමීව කරගෙන යනු ලබන ක්‍රියාවක් සමග ගැටුම් සහගත තත්ත්වයක් ඇති නොවන ආකාරයට ක්‍රියත්මක කළ යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම

**5.** (1) මේ පනතේ විධිවිධානවලට සහ 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීතිවලට යටත්ව, සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම සහ පරිපාලනය කිරීම, මේ පනතේ 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීති මගින් නිශ්චිතව දක්වනු ලබන ධුර දරන්නන්ගෙන් සමන්විත වන (මෙහි මින්මතු "විධායක මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරණ මණ්ඩලයක් විසින් සිදු කරනු ලැබිය යුතු ය.

(2) (අ) මේ පනත ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී ධුර දරනු ලබන පදනමේ විධායක මණ්ඩලයේ සාමාජිකයින් (ආ) ඡේදය යටතේ සාදනු ලබන රීතිවලට යටත්ව, 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීති මගින් විධිවිධාන සලස්වා ඇති ආකාරයට ප්‍රථම විධායක මණ්ඩලය පත් කරනු ලබන තෙක් හෝ තෝරා පත්කර ගනු ලබන තෙක්, සංස්ථාපිත මණ්ඩලයේ අතුරු මණ්ඩලය ලෙස කටයුතු කළ යුතු ය.

(ආ) 7 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන පරිදි සංස්ථාපිත මණ්ඩලයේ අතුරු පරිපාලනය සඳහා සහ සංස්ථාපිත මණ්ඩලයේ ප්‍රථම විධායක මණ්ඩලයේ සාමාජිකයන් තෝරා පත්කර

ගැනීම සඳහා රීති සෑදීමට සංස්ථාපිත මණ්ඩලයේ අතුරු මණ්ඩලයට බලය ඇත්තේ ය.

(ඇ) අතුරු මණ්ඩලයේ යම් තීරණයක් එම රැස්වීම සඳහා පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර කැමැත්ත මත ගනු ලැබිය යුතු ය.

(ඈ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට අවුරුද්දක කාලයක් ඇතුළත සංස්ථාපිත මණ්ඩලයේ ප්‍රථම විධායක මණ්ඩලය පත්කිරීම හෝ තෝරා පත්කර ගැනීම කළ යුතු ය.

(3) (අ) අනුශාසකවරුන් සහ උපදේශකවරුන් ඇතුළුව විධායක මණ්ඩලයේ සෑම ධුර දරන්නකුම වර්ෂ තුනක කාලයක් සඳහා පත්කර ගත යුතු හෝ තෝරාපත්කර ගැනීම කළ යුතු අතර, එම අවුරුදු තුනක කාලසීමාව ඉකුත්වීමෙන් පසුව එම ධුර දරන්නා, අනුශාසකවරයා හෝ උපදේශකවරයා නැවත පත්කර ගැනීම හෝ තෝරාපත්කර ගැනීමට සුදුස්සකු වන්නේ ය.

(ආ) සුසරණ ලංකා පදනමේ නිර්මාතෘ පූජ්‍ය ගලහිටියාගොඩ සුමනරතන හිමියන් සංස්ථාපිත මණ්ඩලයේ, විධායක මණ්ඩලයෙ හි සභාපතිවරයා විය යුතු ය. වත්මන් සභාපති හිමියන්ගෙන් පසුවද සභාපති ධුරයට භික්ෂූන් වහන්සේ නමක් පත්කළ යුතු අතර, එම පත් කිරීම සභාපති හිමියන්ගේ යෝජනාවකට අනුව විධායක මණ්ඩලයේ එකඟතාව මත සිදුකළ යුතු ය .

(ඇ) යම් ධුර දරන්නකු මිය යාම, ඉල්ලා අස්වීම, අකාර්යක්ෂමතාවය හෝ ධුරයෙන් ඉවත් කිරීම නිසා ධුරයක පුරප්පාඩුවක් ඇතිවන අවස්ථාවක දී, විධායක මණ්ඩල විසින් සංස්ථාපිත මණ්ඩලයේ රීති සැලකිල්ලට ගෙන එම පුරප්පාඩුව පිරවීම සඳහා යම් තැනැත්තකු තෝරා ගැනීම හෝ තෝරා පත්කර ගැනීම කළ යුතු ය.

(ඈ) (ඇ) ඡේදය යටතේ තෝරාගත් හෝ තෝරා පත්කර ගනු ලැබූ තැනැත්තා, ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ බලතල

**6.** මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ මුදුන්පත් කරගැනීමේ කාර්යය සඳහා පහත සඳහන් සියලු ක්‍රියා සහ කාරණා කිරීමේ, ඉටු කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාපිත මණ්ඩලයට තිබිය යුතු ය:-

(අ) සංස්ථාපිත මණ්ඩලයේ කාර්යය සඳහා අවශ්‍ය වන්නා වූ ඉඩම් හෝ ගොඩනැගිලි මිලදී ගැනීම, කුලියට ගැනීම, ඉදිකිරීම සහ අලුත්වැඩියා කිරීම සහ අන්‍යාකාරයකින් ලබා ගැනීම සහ සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව විධායක මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි ඒවා සම්බන්ධයෙන් ක්‍රියා කිරීම හෝ ඒවා බැහැර කිරීම;

(ආ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා හෝ එහි බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන පරිදි සෘජුව හෝ සංස්ථාපිත මණ්ඩලය විසින් ඒ සම්බන්ධයෙන් බලය පවරන ලද නිලධරයකු හෝ අනුයෝජිතයකු මාර්ගයෙන් යම් කොන්ත්‍රාත්තු හෝ ගිවිසුම්වලට ඇතුළත්වීම, ක්‍රියාත්මක කිරීම හෝ කරගෙන යාම;

(ඇ) ඇප සහිතව හෝ රහිතව ණයට ගැනීම සහ රැස්කිරීම සහ මුදල් හෝ ද්‍රව්‍යවලින් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ලබා ගැනීම:

එසේ වුව ද, සංස්ථාපිත මණ්ඩලය වෙත ලබාදෙන සියලු විදේශීය ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන් විධායක මණ්ඩලය විසින් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතය ලබා ගත යුතු ය;

(ඈ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගනුදෙනු කළ හැකි සාධනපත්‍ර සකස් කිරීම, ලිවීම, භාර ගැනීම, වට්ටම් දීම, පිටසන් කිරීම, ගනුදෙනු කිරීම, මිලට ගැනීම, විකිණීම සහ නිකුත් කිරීම සහ විධායක මණ්ඩලය විසින් අනුමත කරනු ලබන ශ්‍රී ලංකාවේ යම් බැංකුවක හෝ බැංකුවල ගිණුම් විවෘත කිරීම, ක්‍රියාත්මක කිරීම, පවත්වාගෙන යාම සහ වසා දැමීම;

(ඉ) සංස්ථාපිත මණ්ඩලයේ කාර්යයන් සඳහා වහාම අවශ්‍ය නොවන යම් අරමුදල් විධායක මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයකින් ආයෝජනය කිරීම;

(ඊ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව,සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති යම් නීත්‍යානුකූල භාරයක් හෝ නිශ්චල හෝ පෞද්ගලික දේපළක් භාර ගැනීම, පිළිගැනීම, ක්‍රියාත්මක කිරීම, ඉටුකිරීම සහ පරිපාලනය කිරීම;

(උ) සංස්ථාපිත මණ්ඩලයේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයෙහි නියුක්ත කිරීම, සේවයෙන් පහකිරීම, සේවය අවසන් කිරීම සහ ඔවුන් විෂයයෙහි විනය පාලනය පවත්වාගෙන යාම සහ සංස්ථාපිත මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි වැටුප්, දීමනා සහ පාරිතෝෂික ගෙවීම;

(ඌ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව දේශන, සම්මන්ත්‍රණ සහ සමුළු සංවිධානය කිරීම;

(එ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති අනෙකුත් දේශීය හා විදේශීය ආයතන සමඟ සම්බන්ධතා පවත්වාගෙන යාම සහ සම්බන්ධීකරණය කිරීම; සහ

(ඒ) සංස්ථාපිත මණ්ඩලයේ කාර්යය සඳහා ශ්‍රී ලංකාවේ දී හෝ විදේශයන්හි දී නිලධරයන් සහ සේවකයන් පුහුණු කිරීම.

සංස්ථාපිත මණ්ඩලයේ රීති

**7.** (1) සංස්ථාපිත මණ්ඩලය විසින්, කලින් කල යම් මහ සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, හා සභාපති හිමියන්ගේ අවසන් තීරණය ප්‍රකාරව පහත සඳහන් සියලු කාරණා හෝ ඉන් කිසිවක් සඳහා, මේ පනත හෝ වෙනත් යම් ලිඛිත නීතියකයට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යානුකූල විය යුතු ය:—

(ඇ) පහත සඳහන් පරිදි සමාජිකත්වය වර්ග කිරීම, සමාජිකයන් විසින් ගෙවිය යුතු ගාස්තු නිර්ණය කිරීම, සමාජිකයන් ඇතුළත් කර ගැනීම, නෙරපීම හෝ ඉල්ලා අස්වීම;

විද්වතුන්, වෘත්තිකයන්, යෞවනයින් හෝ වෙනත් ඕනෑම පුද්ගලයෙකුට පදනමේ මූලික අරමුණු හා ආචාර ධර්ම පද්ධතියට ද ව්‍යවස්ථාවට ද අනුකූලව ක්‍රියා කිරීමට එකඟ වන්නේ නම් පදනමේ සාමාජිකත්වය සඳහා අයදුම් කළ හැකිය. එවැනි සෑම අයදුම්පතක්ම සභාපති හිමියන්ගේ හා විධායක මණ්ඩලයේ අනුමැතියට යටත් වන්නේ ය. පදනමේ සාමාන්‍ය සාමාජිකත්වය සඳහා වන මූලික ඇතුළත්වීමේ ගාස්තුව රු 1000/-ක් වන අතර, යාවජීව සාමාජිකත්වය සඳහා වන ගාස්තුව රු 5000/-ක් වේ. සාමාජික ගාස්තු සාමාජිකත්වය සඳහා අයදුම් කරන අවස්ථාවේදි ගෙවිය යුතු වේ.

සාමාජිකත්වය වර්ග කිරීම:-

(i) සාමාන්‍ය සාමාජිකත්වය - වාර්ෂිකව සාමාජික ගාස්තු ගෙවන්නා වූ සාමාජිකයින් මීට අයත් වේ.

(ii) යාවජීව සාමාජිකත්වය - සංස්ථාපිත මණ්ඩලය මගින් නිශ්චය කරනු ලබන යම් සාමාජික මුදලක් එකවර ගෙවා සාමාජිකත්වය ලබා ගන්නා සාමාජිකයින් අයත් වේ.

(iii) ගරු සාමාජිකත්වය - මෙම සාමාජික කාණ්ඩයට අයත් වන්නේ සමාජයේ මේ දක්වා කරන ලද යම් විශිෂ්ට සේවයක් උදෙසා හෝ එසේ යම් සේවයක් ඉදිරියට කළ හැකි වන්නේ යැයි නිගමනය කරනු ලබන්නා වූ හෝ පදනමේ අරමුණුවලට අනුව යම් නිශ්චිත ක්ෂේත්‍රයක හෝ කීපයක ඉටුකරනු ලද්දා වූ මෙහෙයක් හේතුවෙන් සභාපති හිමියන් විසින් හා/හෝ විධායක මණ්ඩලය විසින් ආරාධනා කොට පිරිණමනු ලබන සාමාජිකත්වයකි.

(iv) ආශ්‍රිත සාමාජිකත්වය - මෙම සාමාජික කාණ්ඩයට අයත් වන්නේ සංස්ථාපිත මණ්ඩලය යටතේ වූ

විශේෂිත පුහුණුවකට කැඳවනු ලබන හෝ යම් නිශ්චිත කාල වකවානුවක් තුළ පදනමේ නිශ්චිත සේවයක් සඳහා කැපවන සාමාජිකයින් ය. සභාපති හිමියන් හා/හෝ විධායක මණ්ඩලයේ එකඟතාවය මත මෙම සාමාජිකත්වය මත මෙම සාමාජිකත්වය පිරිනමනු ලබන අතර එකී සාමාජිකයා සාමාජික ගාස්තුවෙන් නිදහස් කරනු ලැබේ.

(v) යෞවන සාමාජිකත්වය - යෞවන යෞවනියන් සඳහා සභාපති හිමියන් හා/හෝ විධායක මණ්ඩලයේ එකඟතාවය මත පිරිනමන මෙම සාමාජිකත්වය ද සාමාජික මුදලින් නිදහස් වන්නේය.

(ආ) පහත නම් සඳහන් විධායක මණ්ඩලයේ ධූර දරන්නන් තෝරා පත්කර ගැනීම, ධූර දරන්නන් ධූරය හිස් කිරීම හෝ ධූරයෙන් ඉවත් කිරීම සහ ධූර දරන්නන්ගේ බලතල, කාර්යය සහ කර්තව්‍ය;

(i) ගරු සභාපති/ විධායක අධ්‍යක්ෂක

(ii) ගරු උප සභාපති / අධ්‍යක්ෂක

(iii) ගරු ලේකම් /අධ්‍යක්ෂක

(iv) ගරු උප ලේකම් / අධ්‍යක්ෂක

(v) ගරු භාණ්ඩාගාරික /අධ්‍යක්ෂක

(ඇ) සංස්ථාපිත මණ්ඩලයේ විවිධ නිලධරයන්, අනුයෝජිතයන් සහ සේවකයන් පත්කිරීමේ නියම සහ කොන්දේසි, ඔවුන්ගේ බලතල හා කර්තව්‍යවය;

(ඈ) සංස්ථාපිත මණ්ඩලයේ හෝ විධායක මණ්ඩලයේ යම් රැස්වීම් කැඳවීමේ දී සහ පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්යය පටිපාටිය, එම රැස්වීම් පිළිබඳ දැන්වීම් හා න්‍යාය පත්‍ර, ගණපූර්ණය සහ එම රැස්වීම්වල කටයුතු කරගෙන යාම;

(ඉ) විධායක මණ්ඩලයේ සහ සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයකු වීමට අවශ්‍ය සුදුසුකම් හා නුසුදුසුකම්;

(ඊ) සංස්ථාපිත මණ්ඩලයේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම;

(උ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති දේශීය සහ විදේශීය අනෙකුත් ආයතන සමග සම්බන්ධතා පවත්වාගෙන යාම සහ සම්බන්ධීකරණය කිරීමේ ආකාරය පාලනය කරනු ලබන කාර්යය පටිපාටිය; සහ

(ඌ) සාමාන්‍යයෙන් සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම හා එහි පරමාර්ථ ඉටුකිරීම සහ සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීම.

(2) සංස්ථාපිත මණ්ඩලය විසින් සාදන ලද යම් රීතියක්, මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීතියක් මෙන් එවැනිම රැස්වීමක දී එම ආකාරයෙන් ම සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) (1) වන වගන්තිය යටතේ සාදනු ලැබූ රීති, එකී රීති සාදනු ලැබීමෙන් මාස තුනක් ඇතුළත ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එකී පළ කරනු ලැබූ දිනයේ සිට බලාත්මක විය යුතු ය.

(4) සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් සෑම කල්හි ම සංස්ථාපිත මණ්ඩලයේ බලපවත්වන රීතිවලට යටත් විය යුතු ය.

සාමාජිකයන්ගේ සාමාජික නාමලේඛය

**8.** සාමාජිකයන්ගේ නම්, ලිපින සහ වෙනත් අත්‍යවශ්‍ය තොරතුරු ඇතුළත් කරනු ලැබිය යුතු සාමාජිකයන්ගේ ලේඛනයක් මණ්ඩලය විසින් පවත්වාගෙන යා යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ අරමුදල

**9.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු ය.

(2) සංස්ථාපිත මණ්ඩලය සඳහා සහ ඒ වෙනුවෙන් ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, සාමාජික මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් ලැබෙන සියලුම මුදල්, 6 (ඇ) වගන්තියේ විධිවිධානවලට යටත්ව විධායක මණ්ඩලය විසින් අනුමත කරනු ලබන එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාපිත මණ්ඩලයේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටු කිරීමේ දී සංස්ථාව විසින් දරනු ලබන වියදම් පියවීමට අවශ්‍ය සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

ගිණුම් සහ විගනණය

**10.** (1) සංස්ථාපිත මණ්ඩලයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාපිත මණ්ඩලය විසින් එහි ආදායම සහ වියදම, වත්කම් සහ බැරකම් සහ සංස්ථාපිත මණ්ඩලයේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාපිත මණ්ඩලයේ ගිණුම්, විගණකාධිපතිවරයා විසින් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපතිවරයා විසින් පත් කරනු ලබන සුදුසුකම් ලත් විගණකවරයකු විසින් වාර්ෂිකව විගණනය කරනු ලැබිය යුතු අතර, විගණකාධිපතිවරයා හෝ එකී සුදුසුකම්ලත් විගණකවරයා විසින් සහතික කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ කාර්ය සඳහා ''සුදුසුකම් ලත් විගණකවරයා'' යන්නෙන් -

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක්; හෝ

(ආ) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු ව සිටින්නේ ද, එමෙන් ම ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද, එවැනි වරලත් ගණකාධිකාරී ආයතනයක්,

අදහස් වේ.

**වාර්ෂික වාර්තාව**

**11.** (1) විධායක මණ්ඩලය විසින් සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු පිළිබඳ වාර්තාවක් සෑම මුදල් වර්ෂයක් සඳහා ම සකස් කරනු ලැබිය යුතු අතර, එම වාර්තාව, විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශයද, විගණකාධිපතිවරයා හෝ 10 වන වගන්තියේ සඳහන් කරන ලද සුදුසුකම්ලත් විගණකවරයකු විසින් සහතික කරන ලද සංස්ථාපිත මණ්ඩලයේ සියලු වත්කම් සහ වගකීම් පිළිබඳ ලැයිස්තුවක් ද සමග, වාර්තාව අදාළ වර්ෂයට පසුව එළඹෙන වර්ෂයේ සය මාසයක් ඉකුත් වීමට පෙර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන හෝ 45 වන ව්‍යාවස්ථාව යටතේ අධ්‍යාපන විෂය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය වෙත 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය) පනත යටතේ පත් කරන ලද ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් වාර්තාවට, මුදල් වර්ෂය තුළ දී සංස්ථාපිත මණ්ඩලය වෙත දේශීය හා විදේශීය වශයෙන් ලැබුණු මුදල් පිළිබඳ වෙනම ගිණුම් ප්‍රකාශයක්, සංස්ථාපිත මණ්ඩලය විසින් එළඹෙන ලද සියලු ගිවිසුම් සහ එකඟතා පිළිබඳ විස්තර සහ 7 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාපිත මණ්ඩලයේ රීති අමුණා තිබිය යුතු ය.

**පදනම විසින් සහ පදනමට ගෙවිය යුතු මුදල්**

**12.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයෙහි පදනම විසින් ගෙවිය යුතු සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාපිත මණ්ඩලය විසින් ගෙවනු ලැබිය යුතු අතර, එදිනට පදනමට අයවිය යුතු සියලු ණය සහ ග්‍රාහක මුදල් සහ දායක මුදල් සහ සාමාජික මුදල් මේ පනතේ කාර්යය සඳහා සංස්ථාපිත මණ්ඩලය වෙත ගෙවනු ලැබිය යුතු ය.

**සංස්ථාපිත මණ්ඩලයට චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව**

**13.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නීයාදනයක් හෝ වෙනත් යම් ආකාරයකින් සංස්ථාපිත මණ්ඩලය සතුවන චංචල හෝ නිශ්චල යම් දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට මේ පනතේ විධිවිධානවලට සහ වෙනත් යම් ලිඛිත නීතියකට යටත්ව නීතියෙන් සංස්ථාපිත මණ්ඩලයට හැකියාව සහ බලය ඇති අතර, ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් නීයාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව, 7 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාපිත මණ්ඩලයේ රීතිවලට යටත් ව මේ පනතේ කාර්ය සඳහා සංස්ථාපිත මණ්ඩලය විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය.

**මුදල් සහ දේපළ අදාළ කර ගැනීම**

**14.** කවර ආකාරයකින් හෝ ලබාගන්නා සංස්ථාපිත මණ්ඩලයේ මුදල් හා දේපළ, සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ඉටුකර ගැනීම උදෙසා පමණක් අදාළ කරගත යුතු අතර, එයින් කවර හෝ කොටසක් සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන්ට ලාභාංශ, ප්‍රසාද දීමනා හෝ ලාභ වශයෙන් සෘජුව හෝ අන්‍යාකාරයෙන් නොගෙවිය යුතු හෝ නොපැවරිය යුතු ය.

**සංස්ථාවේ මුද්‍රාව**

**15.** (1) සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව විධායක මණ්ඩලයේ ලේකම්වරයා සහ තවත් සාමාජිකයකු හෝ විධායක මණ්ඩලය විසින් යථා පරිදි බලය දෙනු ලැබූ එහි සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස, කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් ඒ සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. තවද, එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලැබූ අත්සනකට පරිබාහිරව විය යුතු ය.

(2) සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව, විධායක මණ්ඩලයේ ලේකම් වරයා භාරයේ හෝ විධායක මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි විධායක මණ්ඩලයේ යම් ධුර දරන නිලධරයකු භාරයේ තිබිය යුතු ය.

**විසුරුවා හැරීමේ දී ඉතිරි වන දේපළ**

**16.** (1) සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීමේ දී, එහි සියලු ණය සහ බැරකම් ගෙවා සමථයට පත් කිරීමෙන් පසු, කවර හෝ යම් දේපළක් ඉතිරි වුවහොත්, ඒ දේපළ සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර, බෙදා දීම රීති මගින් තහනම් කර ඇත්තා වූ ද, වෙනත් බෞද්ධාගමික ආයතනයකට හෝ බෞද්ධාගමික ආයතනවලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා උචිත බෞද්ධාගමික ආයතනය සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීමට පෙරාතුව ම, 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය කිරීම) පනත යටතේ පත් කරන ලද ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන රෙජිස්ට්‍රාර්වරයාගේ අනුමතය ඇතිව,

සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් විසින් එහි විධායක මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය.

සද්භාවයෙන් කරන ලද ක්‍රියා සඳහා වගකීමෙන් නිදහස් කිරීම

**17.** මේ පනතින් හෝ ඒ යටතේ පවරන ලැබූ බලතල ප්‍රකාරව නැතහොත් මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමෙහි ලා යම් තැනැත්තකු විසින් සද්භාවයෙන් කරනු ලැබ හෝ කරන ලදැයි සලකනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් නඩු පවරනු ලැබීමට හෝ වෙනත් නීති කෘත්‍යයකට ඒ තැනැත්තා යටත් නොවන්නේ ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම

**18.** ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතවක් අති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**19.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.